# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 644 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 15/04/2024 පැය 0600

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ඇලයාපත්තුව පොලිස් වසම.

2024.04.14 වන දින සවස් කාලයේ ඇලයාපත්තුව පොලිස් වසමේ තිබ්බටුවාගම විහාරස්ථානයට යන මාර්ගයේදී පිහියකින් හා කතුරකින් ඇන පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට ඇලයාපත්තුව පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ මහබුලන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙපිරිසක් අතර බීමත්ව ඇති වූ ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ඝාතනය සිදුකල වයස අවුරුදු 43 ක් වන මහබුලන්කුලම ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. ඇලයාපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - හක්මන පොලිස් වසම.

2024.04.15 වන දින අළුයම් කාලයේ හක්මන පොලිස් වසමේ කහටගහකොරටුව ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදීමෙන් මියගොස් ඇති බවට හක්මන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ කහටගහකොරටුව, හක්මන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුට ඔහුගේ බාප්පා විසින් පැරණි අමනාපයක් මත තියුණු ආයුධයකින් පහරදීමෙන් පසු බරපතල තුවාල ලබා ඇල්ලේවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කඹුරුපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති අතර ඝාතනය සිදු කල සැකකරු ප්‍රදේශයෙන් පලා ගොස් ඇත.

මෘත ශරීරය කඹුරුපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා හක්මන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මනුෂ්‍ය ඝාතනයක් - සේරුනුවර පොලිස් වසම.

2024.04.14 වන දින රාත්‍රී කාලයේදී සේරුනුවර පොලිස් වසමේ මහවැලිගම ප්‍රදේශයේ මාර්ගයේදී තියුණු ආයුධයකින් ඇණ පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට සේරුනුවර පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ ආර්බී 03, සේරුනුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කාන්තාවක සමඟ පැවති අනියම් සම්බන්ධතාවයක් හේතුවෙන් එම කාන්තාවගේ පුරුෂයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. ඝාතනය සිදුකල සැකකරු වයස අවුරුදු 30 ක් වූ සුමේධංකරපුර, සේරුනුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බවට හඳුනා ගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දේව ප්‍රතිමාවක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මුල්ලේරියාව පොලිස් ස්ථානය.

2024.04.14 වන දින රාත්‍රී කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ මැණික් අල්ලා දඹරන් වලින් නිමවා ඇති බවට සැකසහිත පත්තිනි දේව ප්‍රතිමාවක් මුදලට අලෙවි කිරීමට සූදානම්ව සිටි පුද්ගලයෙකු මුල්ලේරියාව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී වෙනත් පුද්ගලයෙකු විසින් එම ප්‍රතිමාව අලෙවි කිරීමට ලබාදී ඇති බවට තොරතුරු අනාවරණය වී මෙන් පසු එම පුද්ගලයාද වැල්ලම්පිටිය ප්‍රදේශයේදී විමර්ශන නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 43 වයස් වල පසුවන අංගොඩ හා කඩුවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම ප්‍රතිමාව සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2024.04.14 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ පහලගම ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන පහලගම, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.

2024.04.14 වන දින උදෑසන කාලයේ මෝදර පොලිස් වසමේ 323 වත්ත, පන්සල පාර හා වෙරළ පාර ප්‍රදේශයන්හිදී, මෝදර පොලිස් ස්ථානයේ

නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක්, හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 350 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27, 30 හා 36 වයස්වල පසුවන මෝදර, කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - පුස්සැල්ලාව පොලිස් වසම.**

2024.04.14 වන දින සවස් කාලයේ පුස්සැල්ලාව පොලිස් වසමේ කටුකිතුල ප්‍රදේශයේදී නුවරඑළිය දෙස සිට ගම්පොල දෙසට ධාවනය වූ වෑන් රථයක් ප්‍රපාතයකට පෙරළී අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ රියදුරු ඇතුළු 07 දෙනෙකු තුවාල ලබා වහුගපිටිය රෝහලට ඇතුලත් කර ඇත. ඉන් රිදීගම ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 02 ක පිරිමි දරුවෙකු හා අවුරුදු 65 ක් වන පුද්ගලයෙකු මියගොස් ඇත.

වෑන් රථයේ ගමන් කල පුද්ගලයින් රිදීගම ප්‍රදේශයේ පදිංචි එකම පවුලේ අයවළුන් වන අතර, මොවුන් නුවරඑළියේ සිටි කුරුණෑගල ප්‍රදේශයට ගමන් කරමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇත.

මෘත ශරීර වහුගපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් තුවාල ලැබූ කාන්තාවන් තිදෙනෙකු හා පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා ගම්පොල රෝහලට මාරුකර යවා ඇත. පුස්සැල්ලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. මාරක රිය අනතුරක් - හාලිඇල පොලිස් වසම.**

2024.04.14 වන දින උදෑසන කාලයේ හාලිඇල පොලිස් වසමේ හාලිඇල බණ්ඩාරවෙල මාර්ගයේ හාලිඇල නගරයේදී බණ්ඩාරවෙල දෙස සිට හාලිඇල දෙසට ධාවන වූ කාර් රථයක් රියදුරුට නින්ද යාම හේතුවෙන් රථය පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගය ආසන්නයේ තිබූ ගසක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු, කාර් රථයේ ගමන් ගත් කාන්තාවන් තිදෙනෙක් බරපතල තුවාල ලබා බදුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු කාන්තාවන් දෙදෙනෙකු මියගොස් ඇත. රියදුරු හා අනෙක් කාන්තාව දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබයි.

**මරණකාරියන් අවුරුදු 51 හා 70 වයස්වල පසු වූ පුවක්වත්ත, දොම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර මොවුන් එකම පවුලේ ඥාතීන් වේ.**

මෘත ශරීරය බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හාලිඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - මහියංගණය පොලිස් වසම.**

2024.04.14 වන දින උදෑසන කාලයේ මහියංගණය පොලිස් වසමේ මහියංගණය ගිරාඳුරුකෝට්ටේ මාර්ගයේ නිදහන්ගල ප්‍රදේශයේදී මහියංගණය දෙස සිට ගිරාඳුරුකෝට්ටේ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගය මත පෙරළී ඊට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු, රථයේ ගමන් කළ කාන්තාවන් දෙදෙනෙක්ද, යතුරුපැදිකරුද බරපතල තුවාල ලබා මහියංගණය රෝහලට ඇතුලත් කර ඇත.

ත්‍රීරෝද රථයේ රියදුරු වැඩිදුර ප්‍රතිකාර සඳහා බදුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත. අනෙක් තුවාලකරුවන් මහියංගණය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ නිරිඇල්ල, උඩුනිරිඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මහියංගණය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - කිරිදිවැල පොලිස් වසම.

2024.04.14 වන දින දහවල් කාලයේ කිරිදිවැල පොලිස් වසමේ රදාවාන යක්කල මාර්ගයේ කන්නිමහර හතේ කණුව ප්‍රදේශයේදී යක්කල දෙස සිට රදාවාන දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක රියදුරුට නින්දයාම හේතුවෙන් මාර්ගයේ මාර්ගයෙන් ඉවතට පැන කාණුවේ වැටි ඉවුරේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත.

අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු, පසුපස ගමන් කළ කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු බරපතල තුවාල ලබා රදාවාන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ත්‍රීරෝද රථයේ පසුපස ගමන් කළ කාන්තාව මියගොස් ඇත. පිරිමි පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා ගම්පහ රෝහලටත්, ත්‍රීරෝද රථයේ රියදුරු වැඩිදුර ප්‍රතිකාර සඳහා වතුපිටිවල රෝහලටත් ඇතුලත් කර ඇත.

**මරණකාරිය අවුරුදු 46 වයස්වල පසු වූ අලිවලපල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම අනතුරට පත් අයවළුන් ඥාතීන් වන අතර මෘත ශරීරය රදාවාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරිදිවැල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - අම්බලන්තොට පොලිස් වසම.

2024.04.14 වන දින සවස් කාලයේ අම්බලන්තොට පොලිස් වසමේ බෝලාන 03 ඇල මාර්ගයේදී බෝලාන දෙස සිට බැරගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් හා ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් එකිනෙක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එක් යතුරුපැදියක පැදිකරු හා පසු පැදිකරු බරපතල තුවාල ලබා අම්බලන්තොට රෝහලට ඇතුලත් කර පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට ඇතුලත් කිරීමට රැගෙන යමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 80 ක් වූ රුහුණු රිදියගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - පූගොඩ පොලිස් වසම.

2024.04.14 වන දින රාත්‍රී කාලයේ පූගොඩ පොලිස් වසමේ ගම්පොල ගෙදර පීල්ල මාර්ගයේ ගම්පොල ගෙදර වංගුව අසලදී ලුණුගම පීල්ලගල දෙස සිට ගම්පොල ගෙදර හංදිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගැනීමට නොහැකිව මාර්යෙන් ඉවතට පැන කොන්ක්‍රීට් කණුව ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු බරපතල තුවාල ලබා දොම්පේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ පැලහැල, දොම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය දොම්පේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පූගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - මාතර පොලිස් වසම.

2024.04.14 වන දින රාත්‍රී කාලයේ මාතර පොලිස් වසමේ මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ සාරානන්ද මාර්ගයට හැරෙන හංදිය අසලදී හාමුගේ වත්ත දෙස සිට සාරානන්ද දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඉදිරියෙන් තිබූ තාප්පයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු බරපතල තුවාල ලබා මාතර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ගනේගොඩ, තිහගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - තණමල්විල පොලිස් වසම.

2024.04.14 වන දින රාත්‍රී කාලයේ තණමල්විල පොලිස් වසමේ තණමල්විල තිස්ස මාර්ගයේ අළුත්ගොඩ ප්‍රදේශයේදී තිස්සමහාරාමය දෙස සිට තණමල්විල දෙසට ධාවනය වූ බවුසර් රථයක් මාර්ගයේ ගමන් කල පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු තණමල්විල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ අළුත්ගොඩ, තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තණමල්විල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුර සම්බන්ධයෙන් බවුසර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**